# (62) පුරවැසි අධ්‍යාපනය

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

New

I පත්‍රය - කාලය පැය 01යි.
බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

II පත්‍රය - කාලය පැය 02යි. මුළු ලකුණු 60කි.
පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10කින් සමන්විතය. එක් පිළිතුරකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.
සෙසු ව්‍යුහගත ප්‍රශ්න 6න් 4කට පිළිතුරු සැපයිය යුතු යි. එක් පිළිතුරකට ලකුණු 10 බැගින් ලකුණු 40කි.

| අවසාන ලකුණ ගණනය කිරීම : | | | |
|---|---|---|---|
| | I පත්‍රය | = | 40 |
| | II පත්‍රය | = | 60 |
| | අවසාන ලකුණ | = | 100 |

**I පත්‍රය**

**සැලකිය යුතුයි.**

* **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තොරන්න. (විභාගයේ දී පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ.)

---

**1.** වායු දූෂණයට බලපාන ස්වභාවික ක්‍රමයක් වන්නේ,

(1) අපද්‍රව්‍ය බැහැර කිරීම.
(2) වනාන්තර විනාශ කිරීම.
(3) භූමි කම්පා ඇති වීම.
(4) දූවිලි කුණාටු ඇති වීම.

**2.** මිනිසාගේ සියලු ක්‍රියාකාරකම් හා සිතුම් පැතුම් අනුව ජීවිතය හැඩගස්වා ගැනීම හඳුන්වනු ලබන්නේ,

(1) ජීවන රටාව ලෙස ය.
(2) සංස්කෘතිය ලෙස ය.
(3) ආචාර ධර්ම ලෙස ය.
(4) පෞරුෂත්වය ලෙස ය.

**3.** පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දේශපාලන විධායකය වන්නේ,

(1) ජනාධිපතිවරයා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය යි.
(2) අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය යි
(3) රාජ්‍ය සේවයට අයත් නිලධාරීන් ය.
(4) ඡන්දයෙන් තේරී පත්වන නියෝජිතයන් ය.

**4.** නිෂ්පාදනය කරන භාණ්ඩ වර්ගීකරණය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) පාරිභෝගික භාණ්ඩ, ආර්ථික භාණ්ඩ, ප්‍රාග්ධන භාණ්ඩ.
(2) පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ, ප්‍රාග්ධන භාණ්ඩ.
(3) පාරිභෝගික භාණ්ඩ, ආර්ථික නොවන භාණ්ඩ, ප්‍රාග්ධන භාණ්ඩ.
(4) පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ, ආර්ථික භාණ්ඩ.

**5.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් මූලික අයිතිවාසිකම් යන සංකල්පය පැහැදිළි කෙරෙන ප්‍රකාශය කුමක් ද?

(1) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සඳහන් සියලුම අයිතිවාසිකම් ය.
(2) එක්සත් ජාතීන් විසින් පිළිගෙන ඇති වෛකල්පික සම්මුතිවල සඳහන් අයිතිවාසිකම් ය.
(3) මානව හිමිකම් අතුරින් තෝරාගත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර ඇති අයිතිවාසිකම් ය.
(4) බොහෝ රටවල් මානව හිමිකම් ප්‍රකාශනයට අනුකූලව සකස් කර ගත් අයිතිවාසිකම් ය.

**6.** පරිවර්තන ආර්ථිකයක මූලික ලක්ෂණයකි.

(1) ලාභය අරමුණු කරගෙන නිෂ්පාදනය සිදුවීම.
(2) දේපළ අයිතිය රජය සතු වීම.
(3) පාඩු ලබන රාජ්‍ය ව්‍යවසාය පෞද්ගලීකරණය කිරීම.
(4) නිෂ්පාදන සාධකවල අයිතිය රාජ්‍ය හා පෞද්ගලික අංශ සතු වීම.

**7.** ශ්‍රී ලංකාවේ උත්තරීතර නීතිය වශයෙන් සැලකෙන්නේ.

(1) දණ්ඩ නීති සංග්‍රහයයි. (2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි.
(3) අපරාධ නීතියයි. (4) මානව හිමිකම් පනතයි.

**8.** ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම විකාශනය පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) කෝල්බෲක්. සෝල්බරි, ඩොනමෝර්, මැනිං.
(2) කෝල්බෲක්, ඩොනමෝර්, සෝල්බරි, මැනිං.
(3) කෝල්බෲක්, මැනිං, සෝල්බරි, ඩොනමෝර්.
(4) කෝල්බෲක්, මැනිං, ඩොනමෝර්, සෝල්බරි.

**9.** ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධ පැමිණිලි විභාග කිරීමේ බලය හිමි අධිකරණය වන්නේ,

(1) ශ්‍රේෂ්ඨාධිකරණය යි. (2) අභියාචනාධිකරණය යි.
(3) මහාධිකරණය යි. (4) දිසා අධිකරණය යි.

**10.** මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත කර ගැනීම කෙරෙහි බලපෑ ආසන්නතම හේතුව වන්නේ,

(1) පළමුවන ලෝක යුද්ධයයි. (2) දෙවන ලෝක යුද්ධයයි.
(3) රුසියන් විප්ලවයයි. (4) ප්‍රංශ විප්ලවයයි.

**11.** ව්‍යවස්ථාදායකයේ ප්‍රධාන කාර්යයන් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) රාජ්‍ය සේවය පාලනය කිරීම, ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, නීති ක්‍රියාත්මක කිරීම.
(2) සංවර්ධන සැලසුම් සැකසීම, රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීම, නීති ක්‍රියාත්මක කිරීම.
(3) නීති සම්පාදනය, අය වැය පාලනය, විධායකය පාලනය කිරීම.
(4) නීති සම්පාදනය කිරීම, නීති ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය සේවය පාලනය කිරීම.

**12.** පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් පුරවැසි යුතුකමකි.

(1) පරිසර අලංකරණයට දායක වීම.
(2) පරිසර පිරිවැය තක්සේරු කිරීම.
(3) පරිසර නීති ක්‍රියාත්මක කිරීම.
(4) පරිසරයට සංවේදීව කටයුතු කිරීම.

**13.** පොදු මංමාවත්, මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා යන කාර්යයන් ප්‍රාදේශීය මට්ටමෙන් ඉටු කිරීමට පැවරී ඇති ආයතනය වන්නේ,

(1) පළාත් සභාව. (2) මධ්‍යම ආණ්ඩුව.
(3) පළාත් පාලන ආයතන. (4) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.

**14.** පාලකයන් ප්‍රජාතන්ත්‍රවාදී මාවතට යොමු කිරීම සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කළ හැකි වන්නේ,

(1) නිදහස් ජන මාධ්‍යයන්ට ය. (2) රාජ්‍ය සේවකයන්ට ය.
(3) ස්වේච්ඡා සංවිධානවලට ය. (4) රාජ්‍ය නොවන සංවිධානවලට ය.

**15.** රටක ආර්ථික හා මානව සම්පත් අවභාවිත කිරීම, සංවර්ධනය අඩාල වීමට හේතු වේ. මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ හැකි වඩාත් සුදුසු ක්‍රියාමාර්ගය වන්නේ,

(1) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් ගොඩ නැගීමයි. (2) ඵලදායිතාව වර්ධනය සඳහා කටයුතු කිරීමයි.
(3) කළමනාකරණය නිසි අයුරින් සිදු කිරීමයි. (4) යහපාලන ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමයි.

**16.** බහු සංස්කෘතික සමාජයක සහජීවනයෙන් කටයුතු කිරීම වඩා වැදගත් වීමට හේතුව කුමක්ද?

(1) ජාතීන් අතර සහජීවනය ඇති කළ හැකි වීම.
(2) විදේශ රාජ්‍යයන් ආක්‍රමණය කළ හැකි වීම.
(3) අනෙකුත් සංස්කෘතීන්ට උදව් කළ හැකි වීම.
(4) ජාතියක් ලෙස නැගී සිටීමට හැකි වීම.

**17.** සුළු ආරවුල් බේරුම් කර ගැනීම සඳහා පුරවැසියෙකු වශයෙන් යොමු විය යුතු වඩාත් සුදුසු ආයතනය වන්නේ,

(1) මහේස්ත්‍රාත් උසාවිය. (2) කම්කරු උසාවිය.
(3) සමථ මණ්ඩලය. (4) දිසා අධිකරණය.

**18.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් සමාජ පරිසරයට හානි සිදු විය හැකි හේතුව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ආගමික හා වාර්ගික ගැටුම් ඇති වීම ය.
(2) ලෙඩ රෝග හා වසංගත ව්‍යාප්ත වීම ය.
(3) ජීවීන්ගේ වාසස්ථාන අහිමි වීම ය.
(4) පිරිසිදු ජලය ලබා ගැනීමට අධික පිරිවැයක් දැරීමට සිදු වීමය.

**19.** ඔම්බුඩ්ස්මන්වරයා හෙවත් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් තනතුර ඇති කිරීමේ අරමුණ කුමක්ද?.

(1) විධායක හා පරිපාලන ක්‍රියා මගින් සිදුවන අයිතිවාසිකම් කඩවීම් ආරක්ෂා කර දීම.
(2) පරිපාලන සේවයේදී රාජ්‍ය නිලධාරීන්ට අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දීම.
(3) මානව හිමිකම් කඩවීම වැනි අවස්ථාවලදී පුද්ගලයන්ට නීති ආධාර සැපයීම.
(4) පරිපාලනයට අදාළ නීති රීති හා ව්‍යවස්ථා සම්පාදනයට සහාය වීම.

**20.** ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් තුළ විරුද්ධ පක්ෂයෙන් ඉටු විය යුතු වැදගත් කාර්යයක් වන්නේ,

(1) ආණ්ඩු පක්ෂයේ යහපත් කටයුතු සාර්ථක කර ගැනීමට සහාය දීම.
(2) ආණ්ඩු පක්ෂයේ කාර්යයන් නිරන්තරයෙන් විවේචනයට භාජනය කිරීම.
(3) ආණ්ඩු පක්ෂය විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන යෝජනාවලට විරුද්ධ වීම.
(4) ආණ්ඩු පක්ෂය විසින් ඉදිරිපත් කරන පනත් සඳහා ඡන්දය දීමෙන් වැළකී සිටීම.

**21.** බහු සංස්කෘතික සමාජයක සංස්කෘතික සම්මිශ්‍රණය වේගවත්වීමට බලපාන ප්‍රබල ම සාධකය වන්නේ,

(1) එකම සමාජයක විවිධ ජන කොටස් ජීවත් වීමයි.
(2) ලෝකයේ බලවත් රටවල් කුඩා රටවල් ආක්‍රමණය කිරීමයි.
(3) ගෝලීයකරණය හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුවයි.
(4) කාලයත් සමග ජන සමාජවල ඇතිවන වෙනස්වීමයි.

**22.** සේව්‍ය සේවක දෙපාර්ශවය අතර ඇතිවන වෘත්තීය ගැටලු විසඳා ගැනීමට යොදා ගත හැකි වඩාත් සුදුසු ක්‍රම වේදයකි.

(1) උපදේශනය. (2) සහමන්ත්‍රණය.
(3) මැදිහත්කරණය. (4) සමථකරණය.

**23.** එක්සත් ජාතීන්ගේ සංගමයේ ආරක්ෂක මණ්ඩලය තුළ නිෂේධ බලය හිමි සාමාජික රටවල් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න,

(1) ඇමරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය, ජර්මනිය, චීනය, රුසියාව.
(2) ඇමරිකා එක්සත් ජනපදය, ඉතාලිය, ප්‍රංශය, චීනය, රුසියාව.
(3) ඇමරිකා එක්සත් ජනපදය, ජපානය, චීනය, ප්‍රංශය, රුසියාව.
(4) ඇමරිකා එක්සත් ජනපදය, චීනය, ප්‍රංශය, මහා බ්‍රිතාන්‍යය, රුසියාව.

**24.** ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගතකරණයේ දී යොදාගෙන ඇති ප්‍රධාන පාලන ඒකක නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) මධ්‍යම ආණ්ඩුව, පළාත් සභාව, පළාත් පාලන ආයතන.
(2) පළාත් සභාව, ප්‍රාදේශීය සභාව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.
(3) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, නගර සභාව, මධ්‍යම ආණ්ඩුව.
(4) මහ නගර සභාව, මධ්‍යම ආණ්ඩුව, පළාත් සභාව.

**25.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටුවීම සම්බන්ධයෙන් නිවැරදි කරුණු අඩංගු පිළිතුර තෝරන්න.

A - 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය.
B - 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තිය සංශෝධනය කිරීම.
C - ලැයිස්තු තුනක් යටතේ බලතල වර්ගීකරණය කිරීම.
D - පළාත් ආණ්ඩුකාරවරයා පළාත් සභා ඡන්දයෙන් තෝරා ගැනීම.

(1) A, B සහ C (2) B, C සහ D (3) A, B සහ D (4) A, C සහ D

**26.** ඍජු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පැහැදිළිව දක්නට ලැබෙන්නේ මින් කවර ක්‍රියාවලියක් තුළ ද?

(1) පාර්ලිමේන්තු මැතිවරණයක. (2) ජනමත විචාරණයක.
(3) පළාත් සභා මැතිවරණයක. (4) පළාත් පාලන මැතිවරණයක.

**27.** ගැටුම් නිරාකරණයේදී මැදිහත්කරුවෙකු සතුවිය යුතු වැදගත්ම ගුණාංගය විය යුත්තේ මින් කුමක්ද?

(1) ඉවසීම. (2) අපක්ෂපාතී බව. (3) කාරුණික බව. (4) සවන්දීම.

**28.** ආණ්ඩුවේ විවිධ ස්ථර කෙරෙහි පුරවැසියාගෙන් ඉටු විය යුතු වගකීමකි.

(1) සහන සේවා පවත්වාගෙන යාම. (2) ජාතික අභිමානය ඉහළ නැංවීම.
(3) ගැටුම් අවම වන ලෙස හැසිරීම. (4) නීතිය හා සාමය ආරක්ෂා කිරීම.

**29.** යම් පුද්ගලයෙකුගේ ජීවිතයට හෝ දේපළවලට හානි සිදු කළ විට දඬුවම් පැමිණවිය හැක්කේ,

(1) සිවිල් නීතිය යටතේ ය. (2) අපරාධ නීතිය යටතේ ය.
(3) උඩරට නීතිය යටතේ ය. (4) අන්තර්ජාතික නීතිය යටතේ ය.

**30.** ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පුරවැසියන් සතු අයිතිවාසිකම් සුරක්ෂිත වීම කෙරෙහි පුරවැසියන්ගෙන් ඉටු විය යුතු වැදගත් කාර්යයක් වන්නේ,

(1) අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා සටන් කිරීමයි.
(2) සෙසු අයගේ අයිතිවාසිකම් හා නිදහසට ගරු කිරීමයි.
(3) අයිතිවාසිකම් සුරැකීම සඳහා සංවිධාන පිහිටුවා ගැනීමයි.
(4) අයිතිවාසිකම් කඩ කරන්නන්ට විරුද්ධව නඩු පැවරීමයි.

**31.** යම් රටක වර්ෂයක් තුළ දළ ජාතික නිෂ්පාදිතය එරට මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාවෙන් බෙදූ විට ලැබෙන අගය වන්නේ,

(1) ශුද්ධ දළ ජාතික නිෂ්පාදිතයයි. (2) ප්‍රතිශීර්ෂ දළ ජාතික නිෂ්පාදිතය යි.
(3) මූර්ත දළ ජාතික නිෂ්පාදිතය යි. (4) මූල්‍ය දළ ජාතික නිෂ්පාදිතය යි.

**32.** පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් සාමාජික රටවලට පොදු ලක්ෂණය වන්නේ,

(1) යුරෝපා මහාද්වීපයට පමණක් අයත් වීම.
(2) සංවර්ධිත රටවල් පමණක් වීම.
(3) සංවර්ධනය වෙමින් පවතින රටවල් පමණක් වීම.
(4) බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් නිදහස් වූ රටවල් වීම.

**33.** ධනවාදී අර්ථක්‍රම පවතින රටවල් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ඇමරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය, කියුබාව.
(2) උතුරු කොරියාව, ජපානය, ඕස්ට්‍රේලියාව.
(3) ඇමරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය, ජපානය.
(4) ජපානය, ඕස්ට්‍රේලියාව, කියුබාව.

**34.** දේශපාලන ගැටුම් ඇති වීමට බලපාන ප්‍රධාන හේතුවක් වන්නේ,

(1) දිළිඳුකම (2) බල ව්‍යාප්තිය (3) වර්ණ භේද (4) ආගමික භේද

**35.** අධිකරණය කෙරෙහි ජනතාව තුළ විශ්වාසය හීන වීමට බලපාන ප්‍රධාන හේතුව වන්නේ,

(1) රට තුළ අපරාධ බහුල වීමයි.
(2) අධිකරණය ස්වාධීන හා අපක්ෂපාතී නොවීමයි.
(3) උසාවිවල විභාග වන නඩු ප්‍රමාණය බහුල වීමයි.
(4) විත්තිකරුවන් ඉක්මනින් අධිකරණයට ඉදිරිපත් නොකිරීමයි.

**36.** ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සකස් කිරීමේ දී සැලකිල්ලට ගෙන ඇති මූලික අරමුණු හතර නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ආරක්ෂාව, පැවැත්ම, සංවර්ධනය, සහභාගිත්වය.
(2) අධ්‍යාපනය, ආරක්ෂාව, පැවැත්ම, සංවර්ධනය.
(3) සෞඛ්‍ය, අධ්‍යාපනය, පැවැත්ම, සංවර්ධනය.
(4) අධ්‍යාපනය, සහභාගිත්වය, පැවැත්ම, සංවර්ධනය.

**37.** නූතන රාජ්‍යවල බලය බෙදා හැරීමේ දී සැලකිය යුතු වැදගත් කරුණක් වන්නේ,

(1) වාර්ගික කණ්ඩායම්වල ඉල්ලීම ය.
(2) සම්පත් විසංතුලනයයි.
(3) ප්‍රාදේශීය නායකයන් බිහිකර ගැනීම ය.
(4) කුඩා රාජ්‍යවල පාලන කටයුතු පහසුකර ගැනීම ය.

**38.** පහත දැක්වෙන පිළිතුරු අතරින් "ප්‍රජාතන්ත්‍රවාදය" ජන සමාජ තුළ ස්ථාපිත වීමට බලපාන ප්‍රධාන සාධකය ලෙස සැලකිය හැක්කේ,

(1) රට තුළ යහපත් ආර්ථික මට්ටමක් පැවතීම.
(2) දේශපාලන පක්ෂ රාශියක් රට තුළ ක්‍රියාත්මක වීම.
(3) නියමිත කාලයට මැතිවරණ පැවැත්වීම.
(4) දේශපාලන අවබෝධයකින් යුතු ජනතාවක් සිටීම.

**39.** පහත 'අ' තීරුවේ සඳහන් ප්‍රකාශ 'ආ' තීරුවේ ප්‍රකාශ සමග නිවැරදිව ගැලපූ විට අදාළ පිළිතුර ඇතුළත් කාණ්ඩය තෝරන්න.

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| 1. G.S.P. සහනය ලබා ගැනීම. | A. තාක්ෂණික ආධාර. |
| 2. විදේශ විනිමය ලබා ගැනීම. | B. සංවර්ධන ව්‍යාපෘති. |
| 3. ණය ආධාර ලබා ගැනීම. | C. ජාතික ආරක්ෂාව. |
| 4. විශේෂඥ දැනුම ලබා දීම. | D. විදේශ රැකියා. |
| | E. වෙළඳ ගිවිසුම්. |

(1) A, B, C සහ D (2) C, D, B සහ A (3) B, C, D සහ E (4) A, C, D සහ E

**40.** පහත දැක්වෙන කරුණු අතුරින් නිදහස් හා සාධාරණ මැතිවරණයක පැවතිය යුතු ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.

A - නියමිත කාල සීමාව තුළ මැතිවරණ පැවැත්වීම.
B - ලියාපදිංචි සියලු ම දේශපාලන පක්ෂ මැතිවරණයට සහභාගි කර ගැනීම.
C - නීති රීතිවලට අනුකූලව මැතිවරණ පැවැත්වීම.
D - සියලුම රට වැසියන්ට ඡන්දය පාවිච්චි කිරීමට අවස්ථාව ලබා දීම.

(1) A සහ B (2) A හා C (3) A හා D (4) B හා D

* *

## (62) පුරවැසි අධ්‍යාපනය

**II පත්‍රය**

**සැලකිය යුතුයි.**

* පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

---

**1.** (i) ඡන්ද කොට්ඨාස අනුව ව්‍යවස්ථාදායකයට නියෝජිතයන් තෝරා ගැනීමෙන් අත්වන වාසි දෙකක් ලියන්න.

(ii) ස්විට්සර්ලන්ත සන්ධීය ආණ්ඩුක්‍රමයෙහි ව්‍යවස්ථාදායකය හා විධායකය හඳුන්වනු ලබන නම් පිළිවෙළින් ලියන්න.

(iii) බහු සංස්කෘතික ජන සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් ඇතිවිය හැකි වාසිදායක ප්‍රතිඵල දෙකක් ලියන්න.

(iv) එක්සත් ජාතීන්ගේ සංවිධානය හඳුන්වා දුන් සහශ්‍රක සංවර්ධන ඉලක්ක දෙකක් නම් කරන්න.

(v) දීර්ඝ කාලයක් තිස්සේ දේශසීමා අරගල පවතින දකුණු ආසියානු කලාපීය රටවල් දෙකක් නම් කරන්න.

(vi) නීති මූලාශ්‍ර දෙකක් නම් කරන්න.

(vii) ශ්‍රී ලංකාවේ වර්තමාන පාර්ලිමේන්තුවට ඡන්දයෙන් තෝරා ගන්නා නියෝජිතයන් සංඛ්‍යාව නම් කර, එම නියෝජන ක්‍රමය නම් කරන්න.

(viii) 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වන ව්‍යවස්ථාවේ සඳහන් මූලික යුතුකමක් ලියන්න.

(ix) රටක සංවර්ධන ක්‍රියාවලියේ දී මුහුණපාන ගැටලු සඳහා විසඳුම් දෙකක් යෝජනා කරන්න.

(x) ශ්‍රී ලංකාව සමග සම්බන්ධතා පවත්වන කලාපීය සංවිධානයක් හා ජාත්‍යන්තර සංවිධානයක් නම් කරන්න. (එක කොටසකට ලකුණු 02 බැගින් ලකුණු 20 යි)

**2.** (i) වර්තමාන රාජ්‍යය තුළ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීම අපහසු වීමට බලපාන හේතු දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ප්‍රජාතන්ත්‍රවාදී දිවිපැවැත්ම සඳහා පුරවැසියෙකු වශයෙන් ඔබ තුළ වර්ධනය කරගත යුතු ගුණාංග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ඡන්දදායකයෙකු තම ඡන්ද පාවිච්චි කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (කරුණු තුනට ලකුණු 03)
(විස්තරයට ලකුණු 02)
(මුළු ලකුණු 05)

**3.** (i) ශ්‍රී ලංකාවේ වර්තමාන ව්‍යවස්ථාවට අනුව විධායක බලය ක්‍රියාවට නංවන ස්ථර දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාට පැවරෙන ව්‍යවස්ථාදායක කාර්යයන් තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ඒකකවලට බලය විමධ්‍යගත කිරීමේ දී මතු වූ ගැටලු තුනක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (කරුණු තුනට ලකුණු 03)
(විස්තරයට ලකුණු 02)
(මුළු ලකුණු 05)

**4.** (i) යහපාලනයක තිබිය යුතු මූලික ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) බහු සංස්කෘතික සමාජ ඇති වීමට බලපාන සාධක තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) බහු සංස්කෘතික ජන සමාජයක එකමුතුව ජීවත් වීමේ වාසි තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (කරුණු තුනට ලකුණු 03)
(විස්තරයට ලකුණු 02)
(මුළු ලකුණු 05)

**5.** (i) නීතියේ ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ශ්‍රේෂ්ඨාධිකරණය සතු අධිකරණ බලතලවලට උදාහරණ තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) අධිකරණයේ ස්වාධීනත්වය ඇති කිරීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග තුනක් නම් කර, ඉන් එකක වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (කරුණු තුනට ලකුණු 03)

(විස්තරයට ලකුණු 02)

(මුළු ලකුණු 05)

**6.** (i) වර්තමාන ලෝකයේ සම්පත්වල ඵලදායීතාව දියුණු කිරීමට යොදා ගන්නා උපාය මාර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) තිරසර සංවර්ධනය සඳහා පුරවැසියෙකු විසින් ඉටු කළ යුතු යුතුකම් තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) තිරසර සංවර්ධනය පවත්වාගෙන යාම සඳහා රජය මගින් ඉටු කළ යුතු කාර්යයන් තුනක් නම් කර, ඉන් එකක් පැහැදිලි කරන්න. (කරුණු තුනට ලකුණු 03)

(විස්තරයට ලකුණු 02)

(මුළු ලකුණු 05)

**7.** (i) ජාත්‍යන්තර සබඳතා පවත්වන මාධ්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ජාත්‍යන්තර සබඳතා වර්ධනය කර ගැනීමට බලපා ඇති හේතු තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ජාත්‍යන්තර සබඳතා ගොඩ නගා ගැනීමෙන් අත්වන ප්‍රතිඵල තුනක් ලියා ඉන් එකක් විස්තර කරන්න.

(කරුණු තුනට ලකුණු 03)

(විස්තරයට ලකුණු 02)

(මුළු ලකුණු 05)

* * *